සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ—

(අ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ අවධානයක් සහිතව භාෂා අධ්‍යාපනය සහ භාෂා දැනුම ප්‍රවර්ධනය කිරීමට, වැඩි දියුණු කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම;

(ආ) අඩු වරප්‍රසාද ලත් ජනතාවගේ සමස්ත සුබසාධනය ප්‍රවර්ධනය කිරීමට, වැඩි දියුණු කිරීමට සහ පවත්වාගෙන යාමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ, උපදේශනය හෝ උපදෙස් ලබා දීම;

(ඇ) අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, සාහිත්‍යය, කලා, සෞන්දර්යය අධ්‍යයනය සහ ක්‍රීඩා යන ක්ෂේත්‍රවල ජනතාවගේ හැකියාවන් සහ දක්ෂතා ප්‍රවර්ධනය කිරීමට, වැඩි දියුණු කිරීමට, සංවර්ධනය කිරීමට සහ පවත්වාගෙන යාමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම;

(ඈ) මානව හිතවාදී අදහස්, ප්‍රජාතන්ත්‍රවාදී හා බහුත්ව වටිනාකම්, යහපත් පුරවැසිභාවය සහ දේශානුරාගී සංකල්ප සහ විශ්වාස ප්‍රවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම සහ පෝෂණය කිරීම;

(ඉ) රටේ ගම්බද ප්‍රදේශවල ප්‍රජා සංවර්ධන පහසුකම් සංවිධානය කිරීමට, පිහිටුවීමට සහ ඇති කිරීමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම සහ ස්වයං සංවර්ධනය හා ස්වයං සේවා නියුක්තියේ ඇති වටිනාකම් පිළිබඳව ගැමි ජනතාවට අවබෝධයක් ලබා දීම, ඉගැන්වීම සහ දැනුවත් කිරීම;

(ඊ) නවීන තාක්ෂණික නිපුණතා පිළිබඳව ප්‍රවීණත්වයක් ලබා ගැනීමට තරුණයන් දිරිමත් කිරීම සහ ඔවුන්ට සහාය වීම;

(ඩ) ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් කුසලතා හා හැකියාවන් ද, ව්‍යාපාර, තාක්ෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් පර්යේෂණ හා පුහුණු කිරීම මෙන්ම ආදායම් උපදවන සහ ස්වයං සේවා නියුක්ති ව්‍යාපාර පිළිබඳ සංකල්ප වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඪ) දැනුම සහ විනයාත්මක චින්තනය වැඩිදියුණු කිරීම දිරිමත් කරවන ක්‍රියා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සේවා සැපයීම;

(එ) වාණිජ කටයුතුවලදී භාවිතා කරනු ලබන ජාත්‍යන්තර භාෂා පිළිබඳ ප්‍රවීණත්වය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දීම;

(ඒ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඔ) දුප්පත් හා අසරණ සිසුන් සඳහා ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම;

(ඕ) පරිසරය සහ වනාන්තරවල වටිනාකම සහ නවීන තාක්ෂණයෙන් සිදුවන පාරිසරික බලපෑම, වන වගාව, වන විනාශය සහ පරිසර දූෂණය හා ඊට අදාළ අනතුරුදායක තත්වයන් පිළිබඳව ශ්‍රී ලාංකීය පුරවැසියන් දැනුවත් කිරීම;

(ක) විවිධ සංස්කෘතික, ආගමික හා ජනවාර්ගික කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධතාවය, සහයෝගය සහ සහායවීම, සමගිය, අදහස් හුවමාරු කර ගැනීම සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සංවිධානය කිරීම සහ ඇති කිරීම;

(ග) සංස්කෘතික, ආර්ථික, විද්‍යාත්මක හා අධ්‍යාපනික කටයුතු පිළිබඳ සෑම ක්ෂේත්‍රයකම ජාත්‍යන්තර අවබෝධය, සහයෝගය සහ සහාය ලබාදීම ප්‍රවර්ධනය කිරීමට, සංවර්ධනය කිරීමට සහ පහසුකම් සැලසීමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම; සහ

